# පළමුවැනි මහා දන්සල දුන් රත්නපුරේ මහා රේන්දකාරයා

## සෝමසිරි කස්තුරි ආරච්චි



තමන්ගේ නිවෙසට යාබද ඉඩමේ වැඩ කටයුතු අවසන්වෙමින් පවතින විහාරස්ථාන-යේ කටයුතු උදෙසා මාස්පතාම තම ආතර් පුතා අතේ එහි නායක හාමුදුරුවන්ට අවශ්‍ය මුදල් ප්‍රමාණයක් යැවීම පොන්නහැන්නදිගේ ජෙරමියෙස් දියෙස් මැතිතුමා නොකඩවා සිදුකළ කටයුත්තකි. ඒ ගමන්ම මුදල් නායක හාමුදුරුවන් අතටදී, “මේ සල්ලි අරක්කු සල්ලි නොවෙයි’’ කියලා කියන්නැයිද එතුමෝ තම පුතාට කියා සිටියහ.

තාත්තාගේ ව්‍යාපාරය මත්පැන් ජාවාරම බව ආතර් පුතා හොඳ හැටියට දන්නේය. තම පවුලට අයත් පොල්වතුවල ගස් රාවට මැදගෙන ඒවා කල්තබා අරක්කු බවට පත්කරවාගෙන අලෙවි කිරීම තාත්තාගේ ප්‍රධාන ආදායම් මාර්ගයයි. ප්‍රදේශයේ හා ඉන් පිටතද බලය ලබාගත් අරක්කු තැබෑරුම් මගින් ඒවා අලෙවි කිරීමද බෝතල් කර පිට ප්‍රදේශවලට සැපයීමද ඒ යටතේ නිතිපතාම කෙරෙන කටයුත්තකි. තම පවුලේ පිරිමි හතර දෙනාගෙන් අනෙක් තුන්දෙනා තාත්තාගේ ව්‍යාපාරයට සිය කාලය කැප කළ නමුදු ආතර් පුතා කුඩා කාලයේ සිටම එයට එතරම් කැමැත්තක් නොදැක්වූ බවද පියා දනී. එහෙයින්ම තාත්තා ආතර් පුතා යොදවා ගත්තේ පන්සලේ කටයුතුවලට වැනි පින් අතේ කටයුතුවලට පණිවුඩ පනත්වලට යොදවන්නටය.

තම පවුලට අයත් තැබෑරුම්වලින් තම නිවෙස වන “එඩ්මන් හවුස්’’ මන්දිරය වෙත තැබෑරුම්වලින් එකතුවන මුදල් සම්භාරය ගෙනෙන්නේ ගෝනිවල දමා කරත්තවලිනි. නෝට්ටු කොළ හා කාසි ඇතුළත් එම ගෝනි පිටින්ම අඩුක්කු කිරීමට නිවසේ එක් කාමරයක් වෙන්කර ඇත්තේය. සති ගණනාවක් ඉක්ම ගියායින් පසුවයි නොයෙක්විට එම සල්ලි ගෝනියක් එම කාමරයේ මේසය උඩට හලාගෙන ගණන් කරනු ලබන්නේ. එම සිද්ධිය සුපුරුදු ලෙස සිදුවන්නකි.
එහෙත් තමන් අතේ පන්සලට මුදල් යවද්දී මුදල් දී “මේවා අරක්කු සල්ලි නොවෙයි’’ කියා නායක හාමුදුරුවන්ට කියන්නැයි තාත්තා හැම වාරයකම පාහේ කියන්නේ කුමක් නිසාදැයි ආතර් පුතාට ප්‍රශ්නයක් වූ නමුත් “එසේ නම් තාත්තා මේ සල්ලි මොන සල්ලියි’’ කියා අසන්නට ඒ කිසි දිනෙක පුතා පෙළඹුණේ නැත.

මේ අතර එක් දිනක නායක හාමුදුරුවන්ට පන්සල් කටයුතුවලට හදිසියේ මුදල් අවශ්‍යවී මුදල් එවන දිනට දින දෙකකට පෙර කෙනකු අත කියා එව්වේ “අද මුදල් තිබුණොත් හොඳයි’’ කියාය.
එහෙත් එයට පියාණන් පණිවුඩකරුවට කිවේ “අද සල්ලි නෑ, හෙට හවස ගෙනත් දෙන්නම්’’ කියලා හාමුදුරුවන්ට කියන්න කියලාය. ඉන්පසුව තාත්තා කෙනකුට කතා කර “අනිද්දාට එවන්නට තියෙන මුදල් හෙටට එවන්න යැයි කව්දෝ කෙනෙකු පණිවුඩයක් යවනුද ආතර් පුතා බලාගෙනය. ගෝනි කනක්කුවෙන් කාමරයක් පුරා තිබෙන සල්ලිවලින් මෙයට නොගන්නේ මන්දැයි කුඩා ආතර් පුතාට ප්‍රශ්නයකි.

පසුවදා දහවල් පණිවුඩකරුගේ දැනුම්දීම අනුව කෙනකු මුදල් ප්‍රමාණයක් තාත්තා අතට ගෙනැවිත් දුන් විට එදානම් තාත්තා එම මුදල් නායක හාමුදුරුවන්ට ගෙන ගොස් දෙන්නට කියා ආතර් පුතාට දුන්නේ නැත. එදා පියා කළේ පුතාද සමගම මුදල් රැගෙන නායක හාමුදුරුවන් වෙත යාමය. ගොස් ඒවා පූජා කිරීමය. ඉන්පසු එතුමා කළේ ඒ ගැන මෙතෙක් කල් පුතා අතේ කියා එවූ කතාවේ නිදාන කතාව නායක හාමුදුරුවන් හමුවේ කියා පෑමය.

“නායක හාමුදුරුවනේ, මම හැමදාම වෙනම මුදල් මගෙ මේ පුතා අතේ ඔබ වහන්-සේට එවන විටදි “මේ මුදල් අරක්කු සල්ලි නොවෙයි’’ කියලා කියන්න කියලනෙ කියල එවන්නෙ. මගෙ ගෙදර ගෝනි කනක්කුවේ තියෙන්නෙ අරක්කු සල්ලිනෙ. ඒත් මගෙ පුතාවත් කිසි දවසක මගෙන් ඇහැව්වේ නෑ. එහෙනම් තාත්තෙ මේ සල්ලි මොන සල්ලිද කියලා. නමුත් මේකෙ නියම කතාව අද මම ඔබ වහන්සේ හමුවේ කියන්නම්. මම කුඩා කාලෙ ඉඳලම පොල් එකතු කරලා තෙල් හිඳලා විකුණලා මුදල් ප්‍රමාණයක් එකතු කළා. එහෙම කාලයක්ම එකතු කළ මුදලින් මම අක්කර අසූවක පොල්වත්තක් අරගෙන තියෙනවා. ඊට පස්සෙ මම මෙහෙම මහා පරිමාණයෙන් වතු අරගෙන අරක්කු රේන්ද අරගෙන දියුණු වුණේ. ඉතින් මම ඒ මුදල් පන්සලේ කටයුතුවලට ගාවන්නෙ නැතුව අර මගේ සාධාරණ මුදල් තිබෙන පොල් වත්තෙන් ලැබෙන ආදායමෙන් තමා පන්සල් කටයුතුවලට වියදම දෙන්නේ. මම මේ කරන කටයුත්ත බුදු හාමුදුරුවෝ නොකටයුතු අසාධාරණ ව්‍යාපාරයක් බවට දේශනාකරලා තියෙනවනෙ. ඉතින් මට ව්‍යාපාරයෙන් ලැබෙන ඒ සල්ලි මෙහෙම පින් කටයුත්තට නොයොදා සිදු කරන්නයි මෙහෙම කරන්නෙ’’ යනුවෙන් ඉන්පසුව එතුමෝ කියා සිටියේය.

මෙය පානදුරේ රන්කොත් විහාරයේ නා හිමියන්ටද අතිශය සතුටට කාරණයක්ද වූයේ පන්සලේ ප්‍රධාන දායකයාගේ එක්තරා අන්දමක “අමද්‍යප ප්‍රතිපත්තියක්ද’’ මෙයින් හෙළිවුණු හෙයිනි.
“බොහොම හොඳයි මුදලාලි මහත්ම-යා. ඔබතුමා තුළ තියෙන හොඳ ගතිගුණ පිළිබඳවත් මට කාලෙක ඉඳලම සැහෙන හැඟීමක් තියෙනවා. අදයි මේ ගුණය ගැන දැන ගත්තේ. ව්‍යාපාරික වශයෙන් මොන මොන කටයුතු කළත් ඔබතුමාගේ හදවතේත් යහ පැවතුම් පැත්තක් තිබෙන බව මෙහෙම දැන ගැනීමට ලැබීමත් සතුටකි’’ යනුවෙන් කී නායක හිමියෝ වෙනදාටත් වඩා හැඟීමෙන් යුතුව තාත්තාටත් පුතාටත් සෙත් පිරිතක් කියා ආශිර්වාද කළහ.
මේ කතාව කටින් කට ප්‍රචාරය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් එක් දිනයෙක කලින් පණිවුඩයක් එවා එඩ්මන් හවුස් මන්දිරය කරා වැඩම කළේ ප්‍රදේශයේ නමගිය මහා ස්ථවිර නමක වන රත්මලානේ පරම ධම්මචේතිය පිරුවන් විහාරස්ථානයේ නායක පූජ්‍යවලානේ ධම්මානන්ද හිමිපාණන්ය. සෙලෙස්තිනා රුද්‍රිගු ජරමියෙස් දියෙස් මැතිනිය හා එවේලේ එහි වූ දූ දරුවන් වෙතින් මෙම මහා නාහිමියන් අති උසස් ලෙස පිළිගැනිණ. ගිලන්පස වැළඳීමෙන් පසුව නාහිමියෝ තමන් පැමිණි කාරණය පැහැදිලි කළහ.

“මට ආරංචි වුණා මුදලාලි මහත්මයා රන්කොත් විහාරෙ කටයුතුවලට මාස්පතා මුදල් වශයෙන් දෙන්නෙ අමද්‍යප මුදල් බව. සාධාරණව හරි හම්බ කරපු මුදල් බව. ඔබතුමාගෙ ප්‍රධාන ව්‍යාපාරය බුදුන් වහන්සේ අකැප ව්‍යාපාරයක් වශයෙන් සඳහන් කළ එකක් වුවත් එහි යෙදෙන ගමන්ම මෙවන් ආදර්ශමත් කටයුත්තක් කිරීම ගැන අපටත් ආරංචි වුණාම ඒක ගැන අපිට සතුටු වෙන්න පුළුවන්. ඒ සමඟ ඔබතුමාගෙ ධනයෙන් සිදු කෙරෙන ආගමික. ජාතික සමාජසේවා කටයුතු නිසාත් ඉතිහාස ගත වන මහජන සේවයක් සිදු කෙරෙනවා. බොහොම හොඳයි.

ඒත් මම එක අදහසක් කියන්න කැමැතියි. මේ මත්පැන් ව්‍යාපාරය අධාර්මික කටයුත්තක් නිසා එය ටිකෙන් ටික හෝ අත්හැර දමලා එයින් යැපෙන අයට වෙනත් වැවිලි වගේ ධාර්මික කටයුතුවල යෙදෙන්න අවස්ථාව සලසලා දුන්නොත් හොඳයි කියලා මා හිතනවා. යනුවෙන් උන්වහන්සේ මෙසේ තම පාමුල වැඳ වැටී සිටින මේ මහා ධනවත් දානපති යුවල හා දරුවන් හමුවේ කියා සිටියහ. “අවසරයි අපේ නායක හාමුදුරුවනේ. මම හිතනවා මතු දවසක මගෙ අතින්ම එහෙම කෙරෙන්න ඉඩ තියෙනවා කියලා. යනුවෙන් දියෙස් මැතිතු-මෝ ප්‍රකාශ කරසිටියහ.

“දවසක එහෙම කෙරෙනවා නම් ඒක සමාජයට ලොකු සහනයක් වෙන්න පුළුවන් මුදලාලි මහත්තයෝ. තවත් කාරණයක් ගැනත් කියන්න එක්කලයි අද මම හිතාගෙන ආවෙ. මුදලාලි මහත්මයා ළඟකදි සිල් සමාදන් වුණේ නැද්ද?’’ යනුවෙන් මෙහිදි ධම්මානන්ද නාහිමියන් අසා සිටි විට දියෙස් මහතාණන්ට එයට පිළිතුරු වශයෙන් කුමක් කිව යුතුද යන්න පවා සිතාගත නොහැකි විය. මන්දයත් ඔහු මෙතරම් වූ ධන සම්පත්තියක් හරි හම්බ කළද විවාහවී දරුවන් හැදුවද ජීවිතයේ කිසි දිනෙක සිල් සමාදන්ව නොමැති කෙනෙකු වූ හෙයිනි. එහෙත් ඔහු සිතට දිරිය ඇති කරගෙන නාහිමියන්ගේ අදහසට එකඟව පිළිතුරු දුන්නේය.
“සිල් ගන්නට නම් ළඟකදි ඉඩක් ලැබුණේ නෑ. නායක හාමුදුරුවනේ!’’ යි ඔහු කියා සිටියේ මහත් ආසායයෙනි.
“හොඳයි එහෙම නම් මම කියන්නම් අදහසක්. මේ ලබන වෙසක් පොහොයදා මුදලාලි මහත්මයත් හාමිනේත් පන්සලේ අටසිල් සමාදන් වෙන්න. එතකොට මේ දරුවන්ටත් ආදර්ශයක් වෙනවා. ඔබතුමා වගෙ අනිත් අයටත් ආදර්ශයක් වෙනවා. එදාට දරුවන්ට පුළුවන් දානමාන කටයුතු සම්පාදනය කරන්න’’ යනුවෙන් එවර නාහිමියන් කියා සිටි විට එය සියල්ලන්ගේම සිත් සතන් සතුටට පත්කළ කාරණයක්ද විය.

“එහෙමයි අපේ නායක හාමුදුරුවනේ. ඔබ වහන්සේගෙ ඉල්ලීම මෙවර වෙසක් පොහොයදා අපි දෙදෙනාම ඉෂ්ට සිද්ධ කරනවා. ඒක අනික් අයටත් ආදර්ශයක් වන අයුරින්ම අටසිල් සමාදන් වෙනවා!’’ යි එවර ඔහු කියා සිටියේ නාහිමියන් ළඟ යළිත් වරක් දණ ගසා වැඳ නමස්කාර කරමිනි.
“හොඳයි. බොහෝම හොඳයි. අපි කරන කටයුතුවලින් අනෙක් සත්ජනයන්ටත් ආදර්ශයක් වෙනවා නම් ඒක තවත් මහා පින්කමක් වෙනවා. කවර කටයුතු කොහොම වෙතත් ඔබතුමා මුල්වෙලා දැනට අවුරුදු විසි ගණනකට ඉස්සර වෙලා කරපු පානදුරේ මහා ආගම් වාදය බෞද්ධාගම පිළිබඳව ලෝක ප්‍රසිද්ධියක් ඇති කරවන්නට සමත් වුණා. එයින් සිදු කෙරුණු ප්‍රධානතම බෞද්ධාගමික දායාදය තමා අපේ ඉදිරි පරපුරේ දූදරුවන්ට ක්‍රමවත් බෞද්ධ අධ්‍යාපනයක් ලබා දෙන්නට හැකිවූ එක. සෙන්පති ඕල්කොට්තුමා අපේ රටට පැමිණ සිදුකළ මහා විප්ලවය සිදු කරන්නට ප්‍රධාන වශයෙන්ම මුල් වුණේ ඔබතුමා කියන කාරණය. අපේ ඉතිහාසයේ රන් අකුරින් ලියැවිලා ඉවරයි. ඒක සුළු පටු කාරණයක් නොවෙයි. මහාර්ඝ වූ ජාතික ශාසනික කටයුත්තක්. අපේ රට ජාතිය බෞද්ධාගම තිබෙන තාක් කල් එම කටයුත්ත නිසා ඔබතුමාගේත් ඔබතුමාගේ පරපුරේ නාමයත් ඉහලින්ම කියැවෙනවා. ලියැවෙනවා. එහෙම නම් මෙම වෙසක් පොහොයට දෙදෙනාම පන්සලේ අටසිල් සමාදන් වෙන්න. මගේ ආශිර්වාදය හිමිවෙනවා’’ යි නාහිමියෝ වදාළේ අතිශය සතුටින් යුතුවය.
එදායින් පසු ජෙරමියස් දියෙස් රේන්ද මහත්මයා හැසිරුණේ අමුතුවෙන්ම ආත්මයක් ලද්දකු පරිද්දෙනි. ස්වභාවයෙ-න්ම සැර පරුෂ අයකු වූ ඔහු ඉන්පසුව තම පවුලට පවුලේ දූ දරුවන්ට මෙන්ම සේවක සේවිකාවනට තම ව්‍යාපාරයේ නියුතු අයට විශේෂ ආදරයක් කරුණාවක් දක්වන්නකු බවට පත්විය. වෙනදාටත් වඩා පිනට දහමට සමාජ සේවයට ඇප කැපවූවකු බවට පත්විය. එය සියල්ලන්ගේම සිත් වල එතුමා කෙරෙහි මහත්වූ භක්ත්‍යාදරයක් ඇතිවීමට හේතුවක්ද විය.
වෙසක් මාසයේ මුල සතියේ දිනෙක තමන්ගේ කටයුතු කලින්ම නිමවා දහවල්

29 වන පිටට